# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1616/36 - 2009 අගෝස්තු 27 වැනි බ්‍රහස්පතින්දා - 2009.08.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

එල්. ඩී. බී. 21/78.

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත

27 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27 වන වගන්තියේ (1) වන උපවගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, උසස් අධ්‍යාපන අමාත්‍ය මහාචාර්ය වටරක ආරච්චිලාගේ විශ්වා වර්ණපාල වන මා විසින්, එකී පනතේ 21 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකාවේ සබරගමුව විශ්වවිද්‍යාලයට අදාළව සාදන ලද, 1995 නොවැම්බර් මස 07 දින හා අංක 896/2 දරන අතිවිශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද සහ අවසන් වරට 2009 මැයි මස 21 වන දින හා අංක 1602/19 දරන අතිවිශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය මගින් අවසන් වරට සංශෝධිත නියමයේ උපලේඛනය, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය මත කරනු ලබන මේ නියමයෙන්, එම උපලේඛනයේ I වන තීරයේ දැක්වෙන "සමාජීය විද්‍යා හා භාෂා පීඨය" යන අයිතමය සහ ඊට අනුරූපීව එම උපලේඛනයේ II වන තීරයේ සඳහන් වන්නා වූ සියලු අයිතම ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්, එම නියමය මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

"උපලේඛනය

| *I වන තීරය* *පීඨය* | *II වන තීරය* *අධ්‍යයන අංශය* |
|---|---|
| සමාජීය විද්‍යා හා භාෂා පීඨය | 1. සමාජීය විද්‍යා අධ්‍යයනාංශය |
| | 2. භාෂා අධ්‍යයනාංශය |
| | 3. ඉංග්‍රීසි භාෂා ඉගැන්වීමේ අධ්‍යයනාංශය |
| | 4. ආර්ථික විද්‍යා සහ සංඛ්‍යාන අධ්‍යයනාංශය.". |

මහාචාර්ය වටරක ආරච්චිලාගේ විශ්වා වර්ණපාල,
උසස් අධ්‍යාපන අමාත්‍ය.

2009 අගෝස්තු මස 18 වැනි දින,
කොළඹ දී ය.

09-384


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

1A - G 011638—835 (2009/08)